# නුඹට වැඩිය සඳ වටිනව!

කෙටි කතාව

ලක්ෂ්මන් කොඩිතුවක්කු



කමලාවතී හාමිනේ බුමුතුරුණු ඇතුරූ ගෙබිම මත බොහෝ හෙමින් පා තබන්නේ එතරම් සතුටකින් නොවේ. තම දියණිය ට සහ බෑනා ට අයත් මෙම දෙමහල් නිවස සාදා නිම කෙරුණේ මෑතකදී බව ඈ දන්නේ මෙරටට පා තැබුවායින් පසුව ය. එහි අළුත් සුවඳ තවමත් පහව ගොස් නැත. තමා චාන්දනීගේ තාත්තා සමඟ විවාහයෙන් ඉතිරි කරගත් මුදලකින් ගත් කුඩා ඉඩම් කැබැල්ලක සාදා ගත් බාගෙට සෑදු කුඩා නිවසට එදා ගොඩ වැදුනු දිනය ඇගේ මතකයට ගලා එයි. එදා දැනුනු ඒ සතුට තවමත් සිත් කොනක තැන්පත්ව ඇති බව ඈට සිතෙයි. තමා මෙරටට එන්නට කලින් අළුතින් නිවසක් සාදා පදිංචියට යන බව දියණිය නො කීවේ ඇයි දැයි යන්න කමලාවතී හාමිනේ ට තවමත් ප්‍රහේලිකාවකි. සමහර විට ලංකාවේ පදිංචි තම දුප්පත් සහෝදරයන්, එනම් කමලාවතී හාමිනේගේ බාල දියණිය හා පුතා මේ බව දැනගෙන ඊර්ෂ්‍යාවන්ත සිතක් ඇති කර ගත්තොත් යන සැකය චාන්දනීට දැනුනාවත් දැ යි ඇයට සිතෙයි. තවමත් කුලී නිවෙසෙක පදිංචි තම බාල දියණිය ගැන ඇයගේ සිත කණගාටුවෙන් පිරී යයි. තරමක් වේලා චාන්දනීගේ මගුල් පින්තූරය දිහා බලා සිටි කමලාවතී හාමිනේ බාල දියණියගේ රූපය ඒ තුලින් මවා ගෙන සිතේ සිර වූ දුක් සන්තාපය පිට කිරීමට වෑයම් කළේ වතුර වීදුරුවක් ගෙන එක හුස්මට බීමෙනි. 'කොච්චර නැති උණත් එහෙ උන් සතුටින් ඉන්නවා' එසේ සිතමින් ඇය සිත හදා ගැනීමට වෑයම් කළා ය.

සාලයේ තබා ඇති ලෙදර් පුටු සෙට්ය වසා ඇති රෙද්ද මෑත් කර ඇය තරමක් ඒ දෙස බලා උන්නාය. මෙම පුටුවල චාන්දනී කාටවත් වාඩිවන්නට කියන්නේ නැත. වාඩි වෙනවාටද ඇය අකමැති ය. දූවිලි බිඳක් හෝ යන්තමට වැදී ඇත්නම් ඇය කමලාවතී හාමිනේගේ ඇඟට ගොඩවෙයි. 'අම්මා නිකං ඉන්න එකේ පොඩ්ඩක් මේ දූවිලි ටික ගසලා දාන්න බැරිද?' නිතරම කියවන චාන්දනීගේ වදන් ඇයට ඇසෙයි. ලංකාවේ දී දවල් කෑම වේලෙන් පසු තරමක් වේලා ඇල වී සිටින වේවැල් පුටු සෙට්ය ඇයට මතක් විණි. ඒ සමඟම රෙදි සෝදන යන්ත්‍රයේ 'ටකස්' ගා නවතින හඬ ඇයට ඇසුනාය. තව ටිකකින් සියළු රෙදි වනා අව්වේ වැනීමේ රාජකාරිය ඇය අවසන් කළ යුත්තේ දුව සහ බෑණා පැමිණීමට පෙරය. කවුළුව ළඟට ගොස් තරමක් වේලා අහස දෙස බලා සිටි කමලාවතී හාමිනේ ඒ අසළ ඇති රූපවාහිණී යන්ත්‍රයේ බොත්තම එබුවේ පාළුව මකා ගන්නට මෙනි. තොරතෝංචියක් නැතිව කව්දෝ කියවයි. එම දොඩන ඉංග්‍රීසි වදන් ඇයට තේරුනේ නැත. ඇය යන්ත්‍රය වසා දැම්මාය. ඊට පසු ඇය බිත්තියේ කොනක පෝට්කෝව මත තබා ඇති සුදු පැහැති ප්‍රතිමාව දෙස බලා සිටියාය. එය තමා දන්නා අඳුනන කිසිවෙකුගේ රුවක් නොවේ. සර්ව පිත්තල විකාර රූපයකි. 'මෙතන ට ඡාතික වරයෙක්ගෙ රූපයක් තිබුණානම් කෙතරම් අගේද?'යි ඇයට සිතෙයි.

මුළු තැන් ගෙයි උස් රාක්කයේ පළතුරු වට්ටියකි. ඇපල් මිදි දොඩම් වලින් ඒවා පිරී ඇත. මේ රටේ කොතරම් එම පළතුරු තිබුණාත් වට්ටියේ පළතුරු කවදාවත් නරක් වෙන්නේ හෝ පර වෙන්නේ නැත. ඒවා කෘතීමය. ලංකාවේ ඇඹුල් කෙසෙල් ගෙඩියක සුවඳින් ඒවා මකා ගැනීමට ඇය වෑයම් කළාය. මෙරටට ආ දවස් දෙක තුනට ඇඟ පත තවත් කලු වී වැහැරී ඇතැයි ඇයට දැනේ. ලංකාවේ දී නම් ඇඟ පත ගැන ඈට නිනව්වක් නැත. වයසට යනවා දැනෙන්නේ නැත. සිත සඳක් මෙන්ම තරුණ ය. මෙහි දී සිත කය දෙකම වයසට යන්නේ මුළු හදවත පසාරු කර ගෙන යැයි ඇයට සිතෙයි. මාපටගිල්ලට ඇගේ නෙත් යොමු වුණේ නොදැනුවත්ම ය. ඊයේ දහවල් හොද්දක් හැඳි ගෑමට ගොස් ගෑස් ලිපට පිලිස්සුණ ඇඟිල්ල දෙස ඇය බලා සිටියාය. එතන යන්තම් දිය පට්ටයක් සෑදී ඇත. 'මොනවද අම්මේ ඕකවත් හැඳි ගාන්න බැරිද? පොඩි ළමයෙක් වගේනේ?' දියණිය දෙඩූ වදන් ඇගේ සවන් තුළ තවමත් රැඳී ඇත.

කමලාවති හාමිනේ මෙරටට පා තැබුවේ තම වැඩිමහල් දියණිය වූ චාන්දනීගේ බලවත් පෙරැත්තය මත ය. අවුරුදු දහයක පමණ පිරිමි දරුවකු සිටින තම දියණිය දෙවන දරු ප්‍රසූතිය සඳහා දැන් සිටම සූදානම් වෙයි. කෙසේ හෝ චාන්දනීට තමා මතක් වූයේ දරුවකු ලැබීමට ලංවෙත්ම බව ඈ දනී. ගේ දොර කටයුතු හා දරුවාගේ කටයුතු වලට උදව්වක් ඉල්ලා මෙරටට තමාට එන්නට නොකීවත් සත්‍ය කුමක්දැයි යන්න කමලාවති හාමිනේට හොඳින් තේරුම් ගැනීමට පුළුවන. ඒත් දරු සෙනෙහස හමුවේ ඈ අසරණය.

දියණිය සහ සැමියා දැන් මෙරටේ ස්ථිර පදිංචි කරුවන්ය. ගැබ්බර වුවද තම දියණිය රැකියාව අත හැර නැත. සැමියා සමඟ හිමිදිරි පාන්දර කාරයේ නැගී යන ඇය කොහේදෝ දුම්රිය පොලකින් බැස නැවත බසයක නැගී රැකියා ස්ථානයට යන බව දියණිය ඇයට කියා ඇත. කමලාවතී හාමිනේට ඔය ඉංග්‍රීසි නම් ගම් මතක

*මුණුබුරාට ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ තමාගේ ඉංග්‍රීසි භාෂාවේ නොදැනුවත් කම ය. දියණිය ත් බෑණා ත් ඔහු සමග කතා කරන්නේ ඉංග්‍රීසියෙනි. ඔවුන් දෙදෙනා ට ත් සිංහල බස පිළිකුල් බව කමලාවතී හාමිනේට දැන් වැටහේ.*

නැත. එහෙත් දියණිය වැඩි හිටි නිවාසයක සහකාර හෙදියක් වශයෙන් රැකියාවේ නිරත වන බව පමණක් නම් ඈ දනී. තම වැඩිමහල් මුණුපුරා උදෑසන නවය වන විට පයින්ම ගොස් පාසලට පිටත් කරවන ඇය නැවත ගෙදරට සීරුවෙන් පා තබන්නේ හති දමමිනි. එහෙත් පයින් ගමනට කමලාවතී හාමිනේ කැමති ය. එනමුත් ලොකු මුණුබුරා හරි දඟයෙකි. ඔහුව මේච්චල් කිරීම එතරම් පහසු නැත. පයින් ගමනට වඩා ඇය කලකිරී ඇත්තේ එයට ය.

'පාර අයිනෙන් එක්කං යනකොට බලාගෙන අම්මේ. අතින් තද කරන් අල්ලං පාර පනින්න. ඔය වයසේ ළමයි කවුරුත් ඔහොම තමයි.' තමාගේ වයසත් මහන්සියත් නිසා පාර තොටේදී මුණුපුරා ආං බාං කරගත නොහැකි බව පවසන විට දියණිය දොඩන්නේ ඔය ටික ය. එහෙත් දරුවකු ලැබීමට සිටින තම දියණිය මෙවන් රැකියාවක නිරත වීම කමලාවතී හාමිනේ අනුමත කරන්නේ නැත. චාන්දනී ලැබෙන්න ඉන්න කාලයේ ඇය පරිස්සම් වූ හැටි ඇගේ මතකයට ගලා එන්නේ සිහින් දිය කඩිත්තක් කඳු මුදුනකින් ගලා එන්නාසේය. චාන්දනීගේ අප්පච්චි කොච්චර මාව පරිස්සම් කළාද? තිබ්බිච්ච ආලවන්ත කම තව තවත් මෝරා වැඩී ඇයට රැකවල් ලබා දුන් හැටි මතක් වී කඳුළු බිඳු කීපයක් ඇගේ දෙනෙතින් ගිලිහින.

'ඈ දුවේ ඔය ඉන්න තත්වෙ හැටියට ඔච්චර මහන්සි වෙන්න හොඳද මං අහන්නේ? ටිකක් විවේකීව හිටියොත් නේද හොඳ? ඔච්චරම මහන්සි වෙන්න උඹලට එච්චර අඩුපාඩුවක් එහෙම තියෙනවයැ'

'අම්මා නං කියයි. තව කොච්චර නම් වැඩ තියෙනවද කර ගන්න. තවම මේ ගෙදරට හරියට බඩුවක් වත් ගන්න බැරි වුණා. යාළුවන්ගේ ගෙවල්වල තියෙන බඩු දැක්කහම අපේ ගෙදර ඒවා මොනවද කියලා හිතෙනවා. අනික මෝගේජ් බිල ? අම්මා නම් කියයි ඉතිං. අනෙක අම්මව ගෙන්න ගන්නත් කොච්චර වියදම් වුණාද? දියණියගේ මුවින් සුනාමියක් සේ ගලා හැලෙන වාක්‍ය මාලා හමුවේ කමලාවතී හාමිනේ අසරණය. කුඩා කළ චාන්දනීව තමා ආදරයෙන් රැක බලා ගත් හැටි මතක් වී ඇගේ නෙතට කඳුළු උණායි. ඈ ඒවා තම දෑත්ලෙන් පිස දා ගන්නේ චාන්දනීට නොපෙනෙන්නට ය. තම දියණිය මෙතරම් ආත්මාර්ථකාමී ගැහැණියක් වූයේ කෙසේදැයි ඇයට සිතා ගන්නට වත් බැරි තරම්ය.

තම බෑණා සහ දියණිය තරමක් ආත්මාර්ථකාමී බව දන්න නමුදු ඇය මුලින්ම දියණිය ගේ මෙරට අළුත් නිවසට පා තැබුවේ බලවත් සතුටිනි. තම මුණුපුරාගේ හා දියණියගේ මුහුණ දකින තුරු ඇයට ඉවසුමක් තිබ්බේ නැත. නමුත් දින කිහිපයකින් ඒ සෙනෙහස ටිකින් ටික දිය වී ගියේ සියොලඟ උලන සබන් කෑල්ලක් මෙනි. තමාව ගෙන්නා ගත්තේ කුමන අරමුණකට ද යන වග ඇයට මුලින්ම පැහැදිලි වූ නමුදු මව් කමද අමතක කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමට බෑණා තමා යොදා ගන්නා ආකාරය පිළිබඳ ඇයට ඇත්තේ දැඩි පිලිකුලකි. බෑණා සහ දියණිය පවරන රාජකාරි පිළිබඳව මුල් දිනවල එය එතරම් සිතට කා නොවැදුනත් දැන් ඉතා චාටුවෙන් මව් කමට මුලා වී තමාව මෙහෙකාර කමට පත් කර ඇති බව ඇයට දැන් තේරුම් ගොස් අවසන්ය. තම බෑණාගේ සහ දියණියගේ ඔවදන්, අණ කිරීම් අහිංසකව සහ සානුකම්පිකව විඳ දරා ගත් ඈ නිහඬ සිතින් කඳුළු සැලුවේ ආත්මානුකම්පාවෙනි.

'නිකං ගෙදරට වෙලා ඉන්න එකේ කම්මැලි කම යන්නත් එක්ක වැඩක් පලක් කලාම මොනවා වෙනවද? අනෙක පිට ගෙයක් යැ.' දෝණිය නිතරම කියවන ඒ වදන් වලින් ඇගේ දෙකන් උතුරා පැලෙන්නට ආසන්න ය. දැන් මේ නිවස ඇයට නීතියක් නැති හිරගෙයකි. මුණුපුරා එයට දෙවෙනි නැත. තමා කොපමණ ආදරය ලීලාව පෑවත් ඔහු ඒවා තඹ සතයකට මායිම් නොකරයි. සිංහල භාෂාව කතා කිරීමට තරම් දැනුමක් නැති තම මුණුබුරාට ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ තමාගේ ඉංග්‍රීසි භාෂාවේ නොදැනුවත් කම ය. දියණිය ත් බෑණා ත් ඔහු සමග කතා කරන්නේ ඉංග්‍රීසියෙනි. ඔවුන් දෙදෙනා ට ත් සිංහල බස පිළිකුල් බව කමලාවතී හාමිනේට දැන් වැටහේ.

'සිංහල ඉගෙන ගත්තා කියලා මොකක්ද ඇති වැඩේ අම්මෙ. මමත් මේ කතා කරන්නේ අම්මට ඉංග්‍රීසි බැරි නිසා. නිශ්ශංඛත් හැම තිස්සෙම කියනවා අම්මාට ඉංග්‍රීසි ටිකක් ඉගෙන ගන්න කියලා. ඒ මැදින් නිශ්ශංඛ ඉහළ මාලයේ සිට පහළට බසී. 'ප්‍රංශෙට ගිය එකා ජීවත් වෙන්න ඕන ප්‍රංශෙ විදියට. අපායට ගියත් එහෙමයි. දිව්‍ය ලෝකයටත් එහෙමයි. මෙහෙට ආපු එකා ජීවත් වෙන්න ඕන ඔසියො විදියට.' බෑණාගේ ගොරෙර්සු යන්ත්‍ර කට හඬ ඇගේ සවන් පසාරු කරයි.

පාසල නිම වී ගෙදරට එන මුණුපුරා කෝලා

*පහත මාලගේ පරිගණකය මතට මත් වී සිටින මුණුපුරා මේ සටන ඇසුනත් ඔහු සිටින්නේ වෙන ලෝකයක ය. ඔහු රොබෝවරු සමඟ විශාල සටනකි. උඩුමහලේ සිදු වන්නේ එහිම කොටසක් යැයි ඔහු සිතනවා විය හැකි ය.*

වීදුරුවක් බී කෙලින්ම දුව යන්නේ කොම්පියුටරය වෙත ය. එහි කුඩා තිරය මත ගිණි බෝල ඇවිලෙයි. වෙඩි වරුසාවකි. යකඩ මිනිසුන් එහෙ මෙහෙ දුවයි. වෙඩි තබා ගනියි. ඇතැමෙක් මැරී වැටෙයි. කමලාවතී හාමිනේ ගල් ගැසී ඒ දෙස බලා උන්නා ය. 'ඕවා නවත්තලා පොතක් පතක් බලා ගත්තනම් නරකද පුතේ.' කමලාවතී හාමිනේ හෙමින් සීරුවේ මුණුපුරාට කියවයි. ඔහු පරිඝණක තිරය දෙස බලා ගෙනම කමලාවතී හාමිනේට කාමරයෙන් ඉවත් වන ලෙස අණ කරන්නේ කොමාන්ඩෝ භටයෙකු ලෙසිනි. විනාඩි කීපයකින් ඉලක්කම් කීපයක් තිරය මත දිස්වෙයි. මුණුපුරා හූරේ දමමින් අප්පුඩි තලමින් කමලාවති හාමිනේ දෙස බලා මාපටගිල්ල ඔසවයි.

දිනක් මුනුපුරාට අවවාද දෙන්නට ගොස් බෑණාගෙන් සහ චාන්දනීගෙන් බැණුම් ඇසූ හැටි ඇයට මතක් වෙයි. ඒ ආධිපත්‍ය තුළ නිශ්ශබ්ද වනවා හැර වෙන කිසිවක් ඇයට කළ නොහැකි බව කමලාවති හාමිනේ හොඳින් දනී.

සමහර දිනවල කමලාවතී හාමිනේට නින්ද යන්නෙන් වාඩි වී සිටි තැනම ය. එවැනි දිනවල ගේ දොර වැඩ කටයුතු අතපසු වන්නේ ඇගේ පතේ විඩාව තෙහෙට්ටුව නිසා ය. දිනක් කමලාවති හාමිනේට නින්ද ගිය දිනයක දියණිය ඇඟට කඩා පැන්න හැටි මතක් කරමින් නිදි බර ගතිය ව්‍යර්ථ කිරීමට ඇය වෑයම් කළා ය.

'අඩු ගානේ අම්මට පරිප්පු හොද්දක්වත් හදලා තියන්න බැරි වුණාද?' ඒ වදන් මුළු ගේ පුරාම දෝංකාර දෙන්නාසේ ඇයට ඇසේ. එදා තමන් සමඟ චාම් ජීවිතයක් ගත කළ තම දියණියගේ වෙනස් වීම ඇයට අරුමයකි. නිතරම භෞතික වස්තු හා භාණ්ඩ ගැන දොඩවන, නැති බැරි කම්

16 වන පිටුට